**විදේශ කටයුතු, විදේශ රැකියා සහ සංචාරක අමාත්‍යාංශය**

# ශ්‍රී ලංකා විදේශ සේවා නියුක්ති කාර්යාංශය

# ප්‍රසම්පාදන දැන්වීමයි

## මාර්ගගත තක්කාලීන ගෙවීම් පිළිබඳ තොරතුරු බැංකු වෙතින් ලබා ගැනීම සඳහා පොදු වේදිකාවක් නිර්මාණය කිරීමට අවශ්‍ය මෘදුකාංග විසඳුම සැලසුම් නිර්මාණය, සංවර්ධනය, සැපයීම, ස්ථාපනය, වින්‍යාසගත කිරීම, ක්‍රියාත්මක කරවීම සහ නඩත්තුව සඳහා වන ප්‍රසම්පාදන නිවේදනය

**PR/02/12-34**

විදේශ කටයුතු, විදේශ රැකියා සහ සංචාරක අමාත්‍යාංශයේ අධීක්ෂණය යටතේ ක්‍රියාත්මක වන ශ්‍රී ලංකා විදේශ සේවා නියුක්ති කාර්යාංශයේ (SLBFE) දෙපාර්තමේන්තු ප්‍රසම්පාදන කමිටු (DPC) සභාපති විසින් මාර්ගගත තත්කාලීන ගෙවීම් පිළිබඳ තොරතුරු බැංකු වෙතින් ලබා ගැනීම සඳහා පොදු වේදිකාවක් සංවර්ධනය කිරීම සඳහා මෘදුකාංග සංවර්ධන සේවා සඳහා යෝග්‍යතාපූර්ණ සහ සුදුසුකම්ලත් ලංසුකරුවන් වෙතින් මුද්‍ර, තැබූ ලංසු කැඳවනු ලැබේ.

ජාතික තරගකාරී ලංසුකරණ පටිපාටිය (NCB) මගින් ලංසුකරණය මෙහෙයවෙන අතර, ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ (GOSL) ප්‍රසම්පාදන මාර්ගෝපදේශයන් හි නිර්වචනය කර ඇති සහ ලංසු ලිපි ලේඛනයෙහි දක්වා ඇති සුදුසුකම් අවශ්‍යතා සපුරා ඇති සියලුම යෝග්‍යතාපූර්ණ සහ සුදුසුකම්ලත් ලංසුකරුවන්ට ලංසුකරණය විවෘත වේ.

මේ පිළිබඳව උනන්දුවක් දක්වන යෝග්‍යතාපූර්ණ ලංසුකරුවන්ට වැඩිදුර තොරතුරු, බත්තරමුල්ල, කොස්වත්ත, ඩෙන්සිල් කොබ්බෑකඩුව මාවත, අංක 234, 2 වන මහල, ශ්‍රී ලංකා විදේශ සේවා නියුක්ති කර්යාංශයේ, කළමනාකරු (ප්‍රසම්පාදන) වෙතින් ලබාගත හැක.

- **දුරකථන :** 011-2880550
- **ඊමේල් :** mgr_procurement@slbfe.lk

2026.01.29 දින සිට 2026.02.19 දින දක්වා වැඩකරන දිනයන් හිදී කාර්යාලීය වේලාව තුළදී ඉහත ලිපිනයේදී ගාස්තු ගෙවීමකින් තොරව ලංසු ලිපි ලේඛන පරීක්ෂාකොට බැලිය හැක.

නැවත නොගෙවන ගාස්තුව රු. 5,000.00ක් අයකැමි වෙත ගෙවීමෙන් අනතුරුව ව්‍යාපාරය ලියාපදිංචි කිරීමේ සහතිකයෙහි සහතික කළ පිටපතක් සමග ලංසුකරුගේ ලිපි ශීර්ෂයක් මගින් ලිඛිත ඉල්ලීමක් ඉදිරිපත් කිරීමෙන් 2026.01.29 දින සිට 2026.02.19 දින දක්වා පෙ.ව. 9.00 හා ප.ව. 3.00 අනතුර කාලයේදී SLBFE ප්‍රසම්පාදන අංශයෙන් ලංසුකරණ ලිපි ලේඛන ලබාගත හැක.

ලංසුකරු විසින් ලංසු සමග රු. 100,000.00ක වටිනාකමින්යුත් ලංසු විවෘත කරනු ලබන දින සිට දින 120ක කාලයක් (2026.02.20 – 2026.06.19) සඳහා වලංගු ලංසු සුරක්ෂණයක් අමුණා එවිය යුතුය.

සාර්ථක ලංසුකරු/ ලංසුකරුවන් පිළිගැනීමේ ලිපියේ දින සිට දින 07ක් ඇතුළත, සම්පූර්ණ ලංසු වටිනාකමින් 10%ක වටිනාකමට සමාන කාර්යසාධන ඇපකරයක් ඉදිරිපත් කළ යුතුය. එය පිළිගැනීමේ ලිපියෙහි දිනයේ සිට දින 120ක කාලයක් සඳහා වලංගු විය යුතුය. ටෙන්ඩරය ප්‍රධානය කිරීමෙන් පසු ඔබ මෘදුකාංගය සැපයීමට අපොහොසත් වන්නේනම්, SLBFE විසින් පූර්ව දැනුම්දීමකින් තොරව කාර්ය සාධන බැඳුම්කරය මුදල් කරනු ලැබේ.

ලංසු සුරක්ෂණය සහ කාර්ය සාධන ඇපකරය කොන්දේසි විරහිතව ඉල්ලූ විට ගෙවන ආකෘතියෙන් යුක්ත විය යුතුය. මෙම ලංසු සුරක්ෂණය හා කාර්ය සාධක ඇපකරය ශ්‍රී ලංකාවේ ක්‍රියාත්මක බලපත්‍රලාභී වාණිජ බැංකුවක් විසින්, සභාපති, ශ්‍රී ලංකා විදේශ සේවා නියුක්ති කාර්යාංශය නමින් නිකුත් කරන ලද පිළිගතහැකි බැංකු ඇපකර විය යුතුය.

ලංසු බහා එවන මුද්‍ර, තැබූ කවරයේ ඉහළ වම් කෙළවරේ මාර්ගගත තත්කාලීන ගෙවීම් පිළිබඳ තොරතුරු බැංකු වෙතින් ලබාගැනීම සඳහා පොදු වේදිකාවක් නිර්මාණය කිරීමට අවශ්‍ය, මෘදුකාංග විසඳුම සැලසුම් නිර්මාණය සංවර්ධනය, සැපයීම, ස්ථාපනය, වින්‍යාසගත කිරීම, ක්‍රියාත්මක කරවීම සහ නඩත්තුව සඳහා ප්‍රසම්පාදනය – PR/02/12-34" යන්න පැහැදිලිව සඳහන් කළ යුතුය.

ලංසු 2026.02.20 දින පෙ.ව. 11.00 ට හෝ ඊට පෙර ලැබෙන පරිදි SLBFE, 2 වන මහල, ප්‍රසම්පාදන අංශයෙහි තබා ඇති ටෙන්ඩර් පෙට්ටිය අංක 01 හි තැන්පත් කළ යුතුය. ප්‍රමාද වී ලැබෙන ලංසු ප්‍රතික්ෂේප කරනු ලැබේ. ලංසු භාරගැනීමේ කාලය අවසන් වූ වහාම එම ස්ථානයේ දීම ලංසු විවෘත කරනු ලැබේ. ලංසු විවෘත කිරීමේ අවස්ථාවට ලංසුකරුවන්ට හෝ ඔවුන්ගේ බලයලත් නියෝජිතයින්ට සහභාගි විය හැක.

පූර්ව ලංසු රැස්වීමක් 2026.02.10 දින පෙ.ව. 11.00 ට SLBFE හි කුඩා අධ්‍යක්ෂ මණ්ඩල කාමරයේදී පැවැත්වේ.

කිසිදු හේතු දැක්වීමකින් තොරව ඕනෑම ලංසුවක් ප්‍රතික්ෂේප කිරීමේ අයිතිය දෙපාර්තමේන්තු ප්‍රසම්පාදන කමිටුව සතුවන අතර, ඕනෑම ලංසු ලිපිලේඛනයක් සැකසීමේදී හෝ ඉදිරිපත් කිරීමේදී සෘජුව හෝ වක්‍රව දැරීමට සිදුවන කිසිදු පරිවැයක් නැවත ගෙවීමට වගකීමක් කර්යාංශ මගින් දරනු නොලැබේ.

**සභාපති,**
**ශ්‍රී ලංකා විදේශ සේවා නියුක්ති කාර්යාංශය,**
**අංක 234, ඩෙන්සිල් කොබ්බෑකඩුව මාවත,**
**කොස්වත්ත, බත්තරමුල්ල.**

**දුරකථන/ ෆැක්ස් : 011-2880550/ 2880564/ 2887585**
**ඊමේල් : mgr_procurement@slbfe.lk**

එතෙර සවියට මෙතර අත්වැල